31

# මළගිය ඇත්තෝ නවකතාවේ දෙවොන්දරා සං හා මිනිස් සිතේ ගූඪත්වය

*දහනායක, එච්. ටී.*[1]

එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'මළගිය ඇත්තෝ' නවකතාවේ දෙවොන්දරා සංගේ චරිතයෙන් පුහුදුන් මිනිස් සන්තානයේ ගූඪත්වය විශද කෙරෙන ආකාරය විමර්ශනයට ලක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙම පර්යේෂණයේ දී වැදගත් වන්නේ මළගිය ඇත්තෝ නවකතාවේ ඇතුළත් දෙවොන්දරා සංගේ චරිතයෙහි පවත්නා ගූඪත්වය අනාවරණය කර ගැනීමයි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ දෙවොන්දරා සංගේ චරිතය ගූඪ ලක්‍ෂණ සහිත වූවක් ද යන්නයි. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය වශයෙන් සරච්චන්ද්‍රගේ මළගිය ඇත්තෝ නවකතාව ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත්, ද්විතීයික මූලාශ්‍රය ලෙස ඒ පිළිබඳ ප්‍රාමාණික උගතුන් විසින් සම්පාදනය කරන ලද පර්යේෂණ ග්‍රන්ථයනුත් ඇසුරු කෙරේ. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස නොරිකො සං නම් ජපන් යුවතිය කෙරෙහි ඔහු සිතෙහි හට ගන්නා අප්‍රකාශිත ප්‍රේමය නවකතාව මඟින් පාඨක ප්‍රජාවට අවබෝධ කර ගත හැකි ය. විවිධ විපර්යාසයන්ට තුඩු දෙන දෙවොන්දරා සංගේ චෛතසිකය, ඔහු මරණය දක්වා ම කැඳවා ගෙන යන ප්‍රේමය, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථය, කෝපය ආදි ආවේග හමුවේ කියාත්මක වන්නේ පෘථග්ජන මිනිසාගේ සිතේ ස්වභාවයෙහි පවතින විචලනය ගම්‍යමාන කරමිනි. ඒ මඟින් ගොඩනැගෙන සමාජ දේහයේ ක්‍රියාකාරිත්වය නැවතත් පුද්ගලයා කෙරෙහි බලපවත් වන ආකාරය ද මේ කෘතිය මඟින් ප්‍රකට කෙරේ. එසේ ම පුද්ගල සිතුවිලිවල පවතින භව්‍ය අභව්‍ය රූපණය අවසාන වශයෙන් මිනිසාගේ අභ්‍යන්තර ජීවිතය ප්‍රතිපෝෂණය කිරීම කෙරෙහි සිදු කරන බලපෑම ද දෙවොන්දරා සංගේ චරිතය මඟින් නිරීක්ෂණය කළ හැකි ය. අවස්ථාවෙන් අවස්ථාවට දෙවොන්දරා සංගේ චිත්ත සන්තානයෙහි පැනනඟින ආවේග, මිනිසාගේ සැඟවුණු ජීවිත යථාර්ථය පසක් කරන්නේ කවර පදනමකින්දැයි යන්න මෙහි දී හඳුනාගත හැකි ය. මේ අනුව බලන විට මෙම පර්යේෂණයේ නිගමනය ලෙස මළගිය ඇත්තෝ නවකතාවේ දෙවොන්දරා සංගේ චරිතය නිෂ්ක්‍රීය වූවක් නොව මිනිස් දහමට පොදු සිතුම් පැතුම් සහිත ඇතුළු හදට නැඹුරු වූ පුද්ගල චරිතයක් බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ  මළගිය ඇත්තෝ, දෙවොන්දරා සං, නොරිකො සං, ගූඪත්වය, සරච්චන්ද්‍ර

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර, සිංහල අධ්‍යයනාංශය.*